# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය

## 15 පාඩම


සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 15 පාඩම

# සිව්සස් හැඳින සැනසුම ලබමු

# චතුරාර්ය සත්‍යය



බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ මංගල ධර්ම දේශනාව වූ දම්සක් පැවතුම් සූත්‍රය පස්වග මහණුන් හට දේශනා කළ අවස්ථාව

# චතුරාර්ය සත්‍යය

- මෙය බුදු දහමේ මූලික ඉගැන්වීම ලෙස සැලකිය හැකිය
- ශ්‍රේෂ්ට වූත්, උතුම් වූත් ඇත්ත සතර, චතුරාර්ය සත්‍යය නමින් හැඳින්වේ
- බුදුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී පස්වග මහණුන් අමතා කළ මංගල ධර්ම දේශනාවේ දී ම මෙම මූලික ඉගැන්වීම පහදා ඇත
- බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලා ආර්ය නාමයෙන් හැඳින්වෙන්නේ මෙම උතුම් ආර්ය සත්‍ය හතර අවබෝධ කර ගත් නිසාය
- සත්ත්වයා ඉදිරියේ ඇති මහා ගැටලුව, එයට හේතු, විසඳුම් හා විසඳන මග ද පෙන්වා දෙන මෙම දේශනාව අපගේ මෙලොව ජීවිතයට ද මහඟු මග පෙන්වීමක් කරයි

# චතුරාර්ය සත්‍යය පිළිවෙළින්

1. දුක්ඛ ආර්ය සත්‍යය (දුක පිළිබඳ උතුම් සත්‍යය)
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය (දුක හට ගැනීම පිළිබඳ උතුම් සත්‍යය)
3. දුක්ඛ නිරෝධාර්ය සත්‍යය (දුක නිවීම පිළිබඳ උතුම් සත්‍යය)
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය (දුක නිවීමේ මාර්ගය පිළිබඳ උතුම් සත්‍යය)

# දුක්ඛ ආර්ය සත්‍යය

- අසාර බව, අතෘප්තිකර බව, තුච්ඡ බව, අර්ථශූන්‍ය දුක්ඛ යන බුද්ධ වචනයෙහි ගැඹුරු තේරුමයි
- මෙකී සසර දුක තුන් අකාර යැයි ධර්ම විවරණ වල දැක්වේ

  දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක්)

  විපරිණාම දුක්ඛතා (වෙනස් වීමේ දුක)

  සංඛාර දුක්කතා (ඇති වීම් නැති වීම් හේතුවෙන් හට ගන්නා දුක)

යනුවෙනි

- ඒ අනුව ආහාර, නිවාස, ඇඳුම්, බෙහෙත් ආදී අවශ්‍යතා පිළිබඳ ප්‍රශ්න, ජාතීන් අතර, දේශයන් අතර ඇති ප්‍රශ්න ආදී සියල්ල විසඳා ගත්ත ද සසර දුක පිළිබඳ ප්‍රශ්නය මිනිසා ඉදිරියට එයි. ඔහු එයට මුහුණ දිය යුතු ය

# දුක්ඛ සමුදය ආර්ය සත්‍යය

- මෙම සත්‍යයෙන් ඉහත කී සසර දුක් හට ගැනීමට හේතු සාකච්ඡා කරනු ලැබේ
- සත්ත්වයා විවිධාකාර දුක් පීඩාවලට පත්වන්නේ අහේතුක ව නොවේ. හේතු සාධක ඇතිව ය
- එහි මූල්ක හේතුව නම් මිනිස් සිත්සතන් තුළ මුල් බැස ඇති අසීමිත තණ්හාව යි.අතෘප්තිය යි. නිමක් නැති ආශාව යි. එම තණ්හාව මුල්කොට ගත් සියලු කෙලෙස් දුකට හේතු වේ
- බුදුන් වහන්සේගේ ප්‍රථම උදානයෙහි කියැවෙන පරිදි උන් වහන්සේ සසර නොයෙකුත් ආත්මභාවවල ඉපිද ජරා මරණාදී දුක් දොම්නස්වලට මුහුණ දුන්නේ තණ්හාව නිසාය
- මෙසේ සසර දුකට හේතුවන විවිධ ක්ලේශ ධර්මයන් අතර මූලික වන තණ්හාව මංගල ධර්ම දේශනාවේ දී,

  කාම තණ්හා

  භව තණ්හා

  විභව තණ්හා යනුවෙන් තුන් ආකාරයකට බෙදා දක්වා තිබේ

# දුක්ඛ නිරෝධාර්ය සත්‍යය

- ලෝකය දුක මත පිහිටා ඇති බවත්, ඊට මූලික හේතුව මිනිස් සිත් තුළ ඇති අසීමිත තණ්හාව බවත් පෙන්වා දුන් බුදුන් වහන්සේ එම දුකින් අත්මිදීමට දුක්ඛ නිරෝධාර්ය සත්‍යයෙන් හෙළිකොට වදාළහ
- මුලින් උදුරා දැමූ ගස නැවත පැළ නොවන්නේ පොළොව සමග ඇති සබඳතා නැති වී තිබෙන බැවිනි
- එසේ ම  සසර දුකට මුල් වන තණ්හාව ද මුලින උදුරා දැමීම දුක්ඛ නිරෝධාර්ය සත්‍යය නම් වේ
- එනම් ගස නැවත පැළ නොවන්නා සේ දුක නැවත හට නොගැනීමයි. සසර දුක් කෙළවර විම යි. නිවන් පසක් කිරීම යි

# දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

- මෙම සත්‍යයෙන් දුකින් මිදීමේ මාර්ගය පැහැදිලි කෙරේ
- එම මාර්ගය නම්, මාර්ගාංග වශයෙන් අටකින්ද ශික්ෂා වශයෙන් තුනකින් ද යුක්ත වන ආර්ය මාර්ගය යි
- ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට ඇතුළත් කළ විට පහත පරිදි වේ

# ආර්ය අෂ්ටාංගික මාර්ගය

| | |
|---|---|
| සම්මා දිට්ඨි<br>සම්මා සංකප්ප | ප්‍රඥා |
| සම්මා වාචා<br>සම්මා කම්මන්ත<br>සම්මා ආජීව | සීල |
| සම්මා වායාම<br>සම්මා සති<br>සම්මා සමාධි | සමාධි |

# පුහුණුවට

යථාපිමූලෙ අනුපද්දවේ දළ්හේ - ඡින්නෝපි රුක්ඛෝ පුනරේවරූහති

ඒවංපි තණ්හානුසයේ අනූහතේ - නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං

(ධම්ම පදය - තණ්හා වග්ගය)

(යම් සේ මුල් නිරුපද්‍රිතව තිබියදී කපන ලද ගස නැවත නැවත ලියලයි ද, එමෙක් සියුම් ලෙස හෝ ඇති තණ්හාව ඉවත් නොකළ කල්හි දුක නැවත නැවත හට ගනී)

# තෙරුවන් සරණයි...!